# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 2403/30 - 2024 සැප්තැම්බර් මස 25 වැනි බදාදා - 2024.09.25**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

*මගේ අංකය* : DSWA/LND/4/ACQU1/F1/31.
*සංචාරක හා ඉඩම් අමාත්‍යාංශයේ යොමු අංකය* : එල්ඩී/05/2009/යූඩීඒ/167.

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම අත්කර ගැනීමට රජය අදහස් කරන බැව්, 1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

*ලබා ගැනීමට බලාපොරොත්තු වන ඉඩමේ විස්තර* :-

දකුණු පළාතේ, හම්බන්තොට දිස්ත්‍රික්කයේ, වලස්මුල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 455 වලස්මුල්ල උතුර ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, වලස්මුල්ල ගමේ පිහිටි මැනුම්පති විසින් පිළියෙල කරන ලද 2013.03.28 දිනැති අවසාන ගම් පිඹුරේ අංක 163 හා අතිරේක අංක 40 හා පත්‍ර අංක 39 හි පහත සඳහන් කර ඇති කැබලි අංක 586 :

01. **කැබලි අංක 586**
ඉඩමේ නම: පේරුම කුඹුර *නොහොත්* දඹගහමුල්ල; විස්තරය: ලඳු කැළය; හිමිකම් කියන අය : රජය; මුල් හිමිකම් කියන අය : සංජය වීරසිංහ, අංක 186, ගාලු පාර, රත්මලාන හා ප්‍රේමාවතී වීරසිංහ, අංක 129, මිද්දෙනිය පාර, වලස්මුල්ල; ඉඩම් ප්‍රමාණය: හෙක්ටයාර් 0.1518.

ඉහත සඳහන් ඉඩමට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලු දෙනාම තම තමන් හෝ ඔවුන්ගේ ලියවිලිවලින් බලයලත් අයවලුන් **හෝ 2025 මාර්තු මස 05 වැනි දින පෙ.ව. 10.00** ට වලස්මුල්ල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතු ය.

තව ද, **2025 පෙබරවාරි මස 26 වැනි** දිනට මත්තෙන්, ඒ ඉඩම සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත්, ඒකී ඉඩම ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත්, වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතු ය.

**කුමුදු සී. ලොකුහේවාගම,**
ප්‍රාදේශීය ලේකම්,
වලස්මුල්ල.

2024 සැප්තැම්බර් මස 12 වැනි දින,
වලස්මුල්ල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

EOG 09 - 0165




*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

## ශුද්ධි පත්‍රිකාව

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

*ඉඩම් අමාත්‍යාංශයේ යොමු අංකය* : 03/ජේ/86ඊ/258.
*ප්‍රා. ලේකම්ගේ යොමු අංකය* : තිප්‍රාලේ/අත්/1/640.

ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තිය යටතේ අංක 1621/26 හා 2009.10.01 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද මාගේ දැන්වීමේ වන්දි පරීක්ෂණ දිනය 2009.11.30 යන්න 2024.11.13 ලෙසත්, හිමිකම් ඉදිරිපත් කිරීමට ලබා දී ඇති දිනය 2009.11.23 යන්න 2024.11.06 ලෙසත් සංශෝධනය විය යුතු බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

**ප්‍රියන්තා දිසානායක,**
ප්‍රාදේශීය ලේකම්,
තිඹිරිගස්යාය.

2024 සැප්තැම්බර් මස 10 වැනි දින,
තිඹිරිගස්යාය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

EOG 09 - 0166